# සාම්ප්‍රදායික ගැමි සමාජයේ සහභාගීත්ව සංවර්ධන මූලයන් හා නිදහසින් පසු ගැමි කෘෂිකර්මාන්තයේ ඇති වූ වෙනස්කම් පිළිබඳ විවේචනාත්මක විමසුමක්

*එස්. එම්. ඒ. සමරකෝන්*
පර්යේෂණ හා පුහුණු කිරීමේ නිළධාරී ගොවි කටයුතු පර්යේෂණ හා පුහුණු කිරීමේ ආයතනය

**ශ්‍රී ලංකාව දකුණු ආසියානු කලාපීය පොදු සංස්කෘතික උරුමයන් හා සමාජ ක්‍රමයන්ගේ දායාදයන් ආශ්‍රිතව හැඩගැසුණු පෞරාණික ශිෂ්ඨාචාරයකට උරුම කියන සමාජයකි. මෙරට මුළු ජනගහනයෙන් 80% ක් පමණ ග්‍රාමීය ජනතාව වන අතර ඔවුන්ගේ ප්‍රධාන ජීවනෝපාය වනුයේ කෘෂිකර්මාන්තයයි. විශේෂයෙන් ග්‍රාමීය සමාජය තුළ සාම්ප්‍රදායික ගැමි කෘෂිකර්මාන්තයේ වෙනස්වීම් ගැන කතා කිරීමේ දී සාම්ප්‍රදායික ගැමි සමාජය සකස් වී තිබුනේ කෙසේ ද එසේම එය ක්‍රියාත්මක වූ ආකාරය පිළිබඳව විමසා බැලීම වැදගත් වේ.**

ශ්‍රී ලංකාවේ සාම්ප්‍රදායික ගැමි සමාජය සකස් වී තිබූ මූලික ලක්ෂණ කිහිපයකි. සාම්ප්‍රදායික ග්‍රාමීය සමාජයේ ආර්ථික සංවිධාන බොහෝ දුරට සකස් වී තිබුනේ කෘෂිකාර්මික ඉඩම් මුල් කොට ගෙන ය. විශේෂයෙන් ගැමි ආර්ථිකයේ ජීවනාලිය කෘෂිකර්මාන්තය විය. බොහෝ විට වෘත්තීන් අනුව බලන විට සුළු සුළු වෘත්තීන් කුල ක්‍රමය මත ස්ථරගත වී තිබුන ද සමස්ථ ආර්ථිකයේ අධෝව්‍යුහය ගැමි කෘෂිකර්මය මත පදනම් විය. ගැමි සමාජය බොහෝ විට පවුලේ ශ්‍රමය කැප කිරීම තුළින් කෘෂිකර්මාන්තයට දයකවූ අතරම පවුලෙන් පිටත ශ්‍රමය බෙදී යාම වලක්වාලීම සඳහා දීග විවාහ ක්‍රමය බෙහෙවින් ඔවුනට ඉවහල් විය. සාමූහිකත්වය මුල් කරගත් පවුලේ ඥාතීත්වය මත පදනම් වූ කෘෂිකාර්මික ජීවිතය ඉතා සරළ අපේක්ෂාවන්ගෙන් යුක්ත විය. එසේ ම තරඟකාරීත්වයෙන් ද තොර වුවක් විය.

බොහෝ විට මෙම සමාජය සරල ශ්‍රම විභජනයකින් යුක්ත හා දැඩි ඥාති සම්බන්ධතා වලින් යුත් ඒකකයක් ලෙස පැවතුනි. එසේම එම සමාජයේ එකිනෙකා කෙරෙහි පුද්ගලික වශයෙන් දැන හැඳුනුම්කම්වලින් යුක්ත වූවා මෙන්ම කල්පවතින සමාජ අගයන්ගෙන් යුක්ත වූ කුඩා ජනගහනයක් සහිත හුදකලා ඒකකයක් ලෙස පැවතිනි.

ග්‍රාමීය සමාජය තුළ ශ්‍රම විභජනය අඩු නිසා පවුල තුල පියා බහුකාර්ය පුද්ගලයෙකු විය. පවුලේ තීරණ ගැනීම පිළිබඳ පූර්ණ අයිතිය පියා සතු විය. බොහෝ විට පියාගේ රැකියාව පුතාගේ රැකියාව බවට පත් වේ. එලෙස ගොවියාගේ පුතා ගොවියෙකු ලෙස වෘත්තිමය පැවරීමක් එම සමාජය තුළ ප්‍රමුඛ ලක්ෂණයක් විය. මෙම සමාජය තුළ සමාජ අනුයෝජනය හා මග පෙන්වීම සිදු වූයේ පළමු පරම්පරාවේ වැඩිහිටියන් මගිනි. සාම්ප්‍රදායික වූ ලාංකීක පවුල තුළ අධ්‍යාපනය ලත් පිරිස අතලොස්සකි. නමුත් කුල ක්‍රමය මත ශ්‍රම විභජිත සමාජයක කුලයට ආවේණික රැකියාවේ දැනුම් සම්භාරය එනම් ඔවුන් සතු සාම්ප්‍රදායික තාක්ෂණයත් එමතාක්ෂණය යොද ගන්නේ කෙසේ ද යන්නත් දෙවැනි පරම්පරාවට පවරා දෙනු ලැබුවේ වැඩිහිටි පිරිස් මගිනි. මෙම සමාජය තුල වලංගතාවයට ඇති ඉඩකඩ අඩු වූ අතරම මෙම සාම්ප්‍රදායික ගැමි සමාජය කෘෂිකර්මය පදනම් කර ගත් ස්වයංපෝෂිත ඒකකයක් ලෙස පැවතිනි. මෙම ආර්ථික ක්‍රමය තුළ ගැමියනට තම නිෂ්පාදිත වලින් අතිරික්තයක් ලබා ගැනීමට නොහැකි වූ අතර, බොහෝවිට තම නිෂ්පාදනය පවුලේ අවශ්‍යතා සපුරාලන යැපුම් මට්ටමක පැවතිනි. ඒ අනුව ලාභය පිළිබඳව හැඟීමක් ඔවුනට නොතිබුණු අතර තම අවශ්‍යතා සපුරාගැනීමක් පමණක් එමගින් සිදු විය.

සරල ජීවන ක්‍රමයක් අනුගමනය කරන ග්‍රාමීය ගොවි ජනතාව සැනෙකින් වෙනස් නො වීය. හදිසි වෙනස්වීම් ඔවුන්ගේ ජීවන රටාවට තදින් ම බලපානු ලබයි. එසේ වුව ද සාම්ප්‍රදායික ගැමි සමාජය තුළ විවිධවකවානුවල විශේෂයෙන් බ්‍රිතාන්‍ය පාලන සමය තුළ සිදු කරනු ලැබුවා වූ සමාජ ආර්ථික හා දේශපාලනික වෙනස්කම් පදනම් කරගෙන සාම්ප්‍රදායික ගැමි සමාජය වෙනසකට භාජනය වූ අතරම ගැමි කෘෂිකර්මාන්තය ද වෙනසකට ලක් විනි. මෙහි වැදගත් කඩඉමක් ලෙස 1833 දී ඉදිරිපත් කරන ලද කෝල්බෲක් කැමරන් ප්‍රතිසංස්කරණය වැදගත් වේ. මෙම ප්‍රතිසංස්කරණ වල ප්‍රතිඵලයක් වශයෙන් බ්‍රිතාන්‍ය පාලකයින් විසින් තමන්ගේ අවශ්‍යතාවට ගැලපෙන පරිදි ධනවාදී රාමුවකට පරිවර්ථනය කිරීමට අවශ්‍ය පසුබිම මෙරටේ නිර්මාණය කරන ලදී. මෙහි ප්‍රතිඵලයක් ලෙස ශ්‍රී ලංකාවේ ගැමි සමාජයේ පැවති මූලික රටාව ක්‍රමයෙන් වෙනස්කම් වලට භාජනය විය. වතු ආර්ථිකය හඳුන්වා දීම එය ඉක්මන් කිරීමේ අතිරේක සාධකයක් විය. මෙම කාර්යයන් සියල්ලේම ප්‍රතිඵලයක් වශයෙන් 20 වන සියවස මැද භාගය වන විට ශ්‍රී ලංකාවේ සමාජ සංවිධාන රටාව පුළුල් ප්‍රතිසංස්කරණයකට භාජනය කරනු ලැබී ය.

සම්ප්‍රදායික ගැමි කෘෂි කර්මාන්තය වෙනස්වීමෙහිලා විශේෂයෙන් මෝසම් ආසියාව සහලින් ස්වයං පෝෂණය කිරීමේ පරමාර්ථය ඇතිව ක්‍රියාත්මක කරනු ලැබුවා වූ "හරිත විප්ලවය" මෑත කාලීනව ශ්‍රී ලංකාවේ වී ගොවිතැන කෙරෙහි සෘජුව බලපා ඇත. 1940 ගණන් වල ආරම්භයේ දී වී ගොවිතැනෙහි කිසිදු නම්‍යතාවයක් සිදු නොවුනු අතර ලාංකික ගොවියා තම පාරම්පරික ක්‍රම මගින් ගොවිතැන් කටයුතු කරනු ලැබී ය. එවැනි තත්ත්වයක් තුළ "හරිත විප්ලවය" දියත් කිරීමත් එමගින් අපේක්ෂා කරනු ලැබුවේ සාම්ප්‍රදායික කෘෂිකාර්මික ආම්පන්න යාන්ත්‍රිකකරණය කිරීම, රසායනික පොහොර සහ කෘමිනාශක භාවිතය, සාම්ප්‍රදායික බීජ වර්ග වෙනුවට වැඩි අස්වැන්නක් ලබා දෙන අභිජනනය කරන ලද බීජ වර්ග භාවිතය හා ගොවිපල සංවිධානය කළමණාකරණය කිරීම යන කොන්දේසි ගොවි ජනතාව වෙත ආරෝපණය කරන ලදී. මෙහි ප්‍රතිඵලයක් වශයෙන් සම්ප්‍රදායික ගැමි කෘෂිකර්මාන්තය විශාල වෙනස්වීමකට භාජනය වූ අතරම එම සාම්ප්‍රදායික කෘෂිකර්මාන්තයේ තිබුනා වූ මූලිකාංග පැහැර ගනු ලැබුවා ද යන්න විමසුමට ලක් කල යුතු වැදගත් කරුණකි.

හරිත විප්ලවයේ ප්‍රතිඵලයක් ලෙස කෘෂිකාර්මික ක්ෂේත්‍රය විශාල වෙනස්වීමකට ලක් වූවද බොහෝ ප්‍රදේශයන්හි යැපුම් මට්ටමේ කෘෂිකාර්මික කටයුතු කරන ගොවීන් කෙරේ එය එලෙසින්ම බලපා නැත. කෙසේ වුව ද 1970 දශකයෙන් පසුව ගොවියා කෙරේ එය සෘජුවම බලපානු ලැබීය.

කෘෂිකර්මාන්තය නවීකරණය කිරීමේ අරමුණින් වැඩි අස්වැන්නක් සහිත බීජ වර්ග හඳුන්වා දීමත්, සමගම එනෙක් පැවතුනා වූ

22 පිටුවට ⇨

21 වැනි පිටුවෙන්

**සාම්ප්‍රදයික ගැමි සමාජයේ සහභාගීත්ව.....**

සාම්ප්‍රදයික බීජ වර්ග එම ප්‍රදේශ වලින් අභාවයට ගියේ ය. විශේෂයෙන් 1922 දී පමණ දේශීය වී ප්‍රභේද 527 ක් පමණ සංඛ්‍යාවක් තිබුණු අතර අද වන විට ඉතිරිව ඇති ප්‍රභේද ගණන 08 කි. එසේ ම පැරණි බීජ වර්ග තුළින් නව තවත් යෝග්‍ය බීජ වර්ග නිපදවීම සඳහා වී පර්යේෂණ ආයතන කීපයක් ද එවකට පැවතිනි.

එය එසේ වුවත් සාම්ප්‍රාදයික කෘෂිකර්මය තුළ පැරනි වී වර්ග වලින් වඩා ඉහළ අස්වැන්නක් ලබා ගැනීමට කෘමිනාශක හා රසායනික පොහොර භාවිතා කිරීම අවශ්‍ය වූයේ නැත. නමුත් මෙම අභිජනනය කරන ලද බීජ වර්ග හඳුන්වාදීමත් සමග වැඩි අස්වැන්නක් ලබා ගැනීමට නම් ඒ සඳහා අවශ්‍ය යෙදවුම් වන කෘමි නාශක බෙහෙත්. පොහොර ප්‍රමාණවත් පරිදි යෙදිය යුතු ය. ඒ සඳහා ගොවියාට වැඩි වියදමක් දැරීමට අවශ්‍යවන අතර ම එම යෙදවුම් අවශ්‍ය ප්‍රමා ණයෙන් නොතිබුණහොත් අස්වනු වල අඩුවීමක් දක්නට ලැබේ. එසේම රසායනික පොහොර භාවිතය හේතු කොට ගෙන වී නිෂ්පාදනයේ වෙනසක් සිදු වුව ද එම යෙදවුම් සඳහා වියදම් ඉහළ යාම තුළින් ගොවියාට ආර්ථික වශයෙන් වාසි දයක නොවී ය. නමුත් සාම්ප්‍රදයික කෘෂිකර්මය තුළ ගොවියා කෘමිනාශක නොයෙදූ අතර සිටි කෘමීන් වැනි සතුන් ස්වාභාවික ක්‍රම මගින් විනාශ වී ගිය අතරම තම ගොවිපල සංරක්ෂණය සඳහා මෙතෙක් භාවිතා කරනු ලැබූ සාම්ප්‍රදයික පොහොර වර්ග අතර ගොම පොහොර, කොල පොහොර භාවිතය තුළින් ඈත් වී සාම්ප්‍රදයික ක්‍රම අනුගමනය කරනවා වෙනුවට නව තාක්‍ෂණය යොද ගන්නා ආකාරයක් දක්නට ලැබේ. පැරැ න්නන් තුළ තිබුණු මෙම සාම්ප්‍රදයික ක්‍රම අනුගමනයෙන් ඈත් වීමේ හේතුවෙන් අඩු යෙදවුම් ප්‍රමාණයකින් යුක්ත ඵලදයි ස්වයං පැවැත්මක් සහිත ගොවිතැන් ක්‍රම හීන වී ගොස් ඇති ආකාරයක් දක්නට ලැබේ. මෙම තත්ත්වය නව තාක්‍ෂණය විසින් එල්ල කරනු ලැබූ අභියෝගයක් ලෙස පවතින බව අපට පෙනේ.

මේ ආකාරයට නව තාක්‍ෂණයේ අංගෝපාංග කෘෂිකාර්මික ක්ෂේත්‍රය තුළ ආධිපත්‍යය පැතිරවීම හේතු කොට ගෙන රසායනික පොහොර, කෘමි නාශක බෙහෙත් වර්ග වැනි නිෂ්පාදන යෙදවුම් වල මිල ඉහළ යාමේ ප්‍රතිඵලයක් ලෙස ගොවියාට දැරිය නොහැකි විශාල නිෂ්පාදන වියදමක් ඒ සඳහා යෙදවීමට සිදුවූ අතරම බහුජාතික සමාගම් වල ග්‍රහණයට හසු වී පාරම්පරිකව උරුම කර ගන්නා ලද කෘෂි තාක්‍ෂණය ද අහෝසි වී ගොස් ඇත.

පැරණි සමාජය තුළ ගොවිතැන් කටයුතු සඳහා යොද ගනු ලැබුවේ මී ගවයින්ය. නමුත් කෘෂිකර්ම නවීකරන ක්‍රියාවලිය තුළ 1950 ගණන් වල ආරම්භයත් සමගම අන්තර් ජාතික ගොවි ආයතන මගින් මෙරටට ට්‍රැක්ටර් භාවිතය හඳුන්වා දෙන ලදී. මෙරට ගොවියා වඩා ඉක්මනට තම ගොවිතැන් කටයුත කර ගැනීම සඳහා මී ගවයින් යොද ගන්නවා වෙනුවට ට්‍රැක්ටර් භාවිතා කිරීමට පටන් ගත්තා ලදී. විශේෂයෙන් ජනපද ව්‍යාපාරවල ජලය නියමිත කාලයක් තුළ නිකුත් කිරීම වැනි හේතූන් මත ඉතා ඉක්මණින් තම වැඩකටයුතු කල යුතු බැවින් ගොවියාට එයින් යහපතක් සිදු විය. නමුත් මෙම තත්ත්වය තුළ ගොවියාගේ ශ්‍රමයේ ඵලදයීතාව අඩු වී ඇති අතරම තම හැකියාවන් හා දක්‍ෂතාවයන් විදහා පෑමේ අවස්ථාවන් ද එමගින් ගිලිහී ගොස්ඇත. ඇත්තෙන්ම ට්‍රැක්ටර් භාවිතයේ වාසි මෙන්ම අවාසි ද ඇත. සාම්ප්‍රදයික කෘෂිකර්මය තුළ ගවයන් භාවිතා කිරීමේදී ගව, මූත්‍රා ගොම පසට එකතු වීමෙන් ද, අස්වනු නෙලීමෙන් පසු පිදුරු කුඹුරට දමා පුලුස්සා දැමීමෙන් ද පසට හානියක් සිදු නොවූ අතර පස තවත් සාරවත් කරන ලදී. නමුත් ට්‍රැක්ටර් භාවිතයේ දී ට්‍රැක්ටර් වලින් මුදලන තෙල් හා ඉන් පිටවන දුමාරයන් මගින් පරිසරයට හානියක් සිදු වේ. එසේම ට්‍රැක්ටර් භාවිතය ගොවියාට දැරිය නොහැකි තත්ත්වයට පත්ව ඇත. එනම් අධික වියහියදමයි. එසේ වුව ද ට්‍රැක්ටර් භාවිතය වර්තමානයේ තමාගේ ආර්ථික හා සමාජීය හැකියාවන් පෙන්නුම් කිරීමක් බවට ද පත්ව ඇති ආකාරයක් දක්නට ලැබේ.

මෙවැනි තත්ත්වයක් තුළ නවීකරණ ක්‍රියාවලියට අනුකූලව සමාජ සංවිධාන රටාව ද වෙනස්වීමකට භාජනය වී ඇත. පැරණි ගැමි සමාජ සංවිධාන රටාව කෘෂි කර්මාන්තය මත පදනම් වී තිබුණු අතර නූතනයේ එය නව ආකාරයකට සකස් වී ඇත. එසේම වාණිජ ආර්ථිකය සාම්ප්‍රදයික ගම් ආක්‍රමනය කිරීමත් සමගම සාම්ප්‍රදයික සමාජයේ පැවති ශ්‍රම හුවමාරු පදනම බිඳ වැටිනි. මෙම තත්ත්වය තුළ සාම්ප්‍රදයික කෘෂිකාර්මික සමාජයේ දක්නට ලැබුණු වැදගත් අංගයක් ලෙස "අත්තම් ක්‍රමය" හා "කයිය" වැනි සාමූහික ක්‍රියාවලීන් ගම තුළින් ඉවත් වුනු අතර මූල්‍ය වටිනාකම් වලින් යුත් නව සම්ප්‍රදයක් ව්‍යාප්ත වී ඇති ආකාරයක් දක්නට ලැබිණි.

සාම්ප්‍රදයික ගැමි කෘෂිකර්මාන්තය වෙනස්වීමෙහිලා ඉඩම් සංවර්ධන යෝජනා ක්‍රම ද යම් ආකාරයක බලපෑමක් සිදු කොට ඇත. විශේෂයෙන් ඉඩම් සංවර්ධන යෝජනා ක්‍රම අතීතය දක්වා දිව ගිය ද 70 දශකය තුළ පැවති ඉඩම් සංවර්ධන යෝජනා ක්‍රම රාශියක් ආරම්භ කරන ලදී. ඒ අතර කොලනි හෙවත් ජනපද ව්‍යාපාර, ගම් පුළුල් කිරීමේ ව්‍යාපාර, තරුණ ගොවි ව්‍යාපාර සමුපාකාර ගම්මාන හා සාමූහික ජනාවාස මේ අතර ප්‍රධාන වේ. එසේම 1930 ගණන් වල ආරම්භ වී විකාශනය වුණු ජනාවාසකරන ක්‍රියාවලිය තුළ මෙරට ගැමි කෘෂිකර්මාන්තයේ වෙනස්වීමට මූලික හේතුකාරකයක්වී ඇත. මහවැලි ව්‍යාපාරය වැනි නව ගොවි ජනපද ව්‍යාපාර මෙහි දී වැදගත් වේ.

ඉඩම් සංවර්ධන යෝජනා ක්‍රම පැරණි ගම් වලට වඩා වෙනස් වේ. එම ප්‍රදේශ වල පදිංචි කර ඇත්තේ ලක්දිවේ විවිධ සංස්කෘතික ලක්‍ෂණයන්ගෙන් හා විවිධ නිෂ්පාදන හැකියාවන් වලින් හෙබි විවිධ ප්‍රදේශ වලින් රැගෙන ආ විවිධ ජන කොටස් ය. නමුත් පැරණි ගමක දක්නට ලැබෙන්නේ පරම්පරා එකක් හෝ කීපයක් එම ගමේම වාසය කරන ලද එක් සංස්කෘතික ලක්‍ෂණවලින් හෙබි පිරිසකි. එවැනි ගමක සමගිය සහයෝගය හා සමාජ ඒකාබද්ධ තාවය හොඳින් පැවතිනි. ඉඩම් සංවර්ධන යෝජනා ක්‍රමවල ද මූලික වශයෙන් අරමුණ එය වුව ද එම අරමුනු එලෙසින් ම ක්‍රියාත්මක වූයේ නැත. එහි නොයෙකුත් වෙනස්කම් දැකිය හැක.

ජනපද පිහිටුවීමේ අරමුණ වූයේ පවුල් සංවිධානය මත පදනම් වූ නිෂ්පාදන ක්‍රමයක් බිහි කිරීම ය. එසේ ම සූක්‍ෂම වගා ක්‍රම අනුගමනය කිරීමට ඔවුන් පෙළඹවීම තුලින් ඔවුන්ගේ ජීවන තත්ත්වයන් වැඩි දියුණු කිරීමෙන් නිෂ්පාදන අතිරික්තයක් ලබා ගැනීමත් රජයේ අපේක්‍ෂාව විය. නමුත් ජනපද ක්‍රියාවලිය තුළ බලාපොරොත්තු වූ අරමුණු වලට වඩා සාම්ප්‍රදයික ගැමි සමාජයේ තිබුනා වූ වටිනාකම් බොහෝ දුරට ගිලිහීගොස් ඇත. විශේෂයෙන් මෙම ජනපද යෝජනා ක්‍රමවල සාම්ප්‍රදයික ගැමි සමාජයේ පැවති සාමූහිකත්වය වැනි වටිනා ගුණාංග අහෝසිවී ගොස් ඇත. පැරණි ගැමි සමාජය තුළ තිබුනා වූ නායකත්වය, අන්‍යොන්‍ය සහයෝගීතාවය වැනි ලක්‍ෂණ ලෙස හරකා බාන හුවමාරුව, අත්තම් ක්‍රමය ගැමියා තුළින් අහෝසි වී ගොස් ය. වර්තමානයේ දැකිය හැකි වන්නේ සමාජ ඒකාබද්ධතාවය වෙනුවට සමාජය විසංවිධානය වී ඇති ආකාරයකි. මෙම නව ජනපද තුළ මෑතක දී සොයා ගන්නා ලද තොරතුරු අනුව විශේෂයෙන් මහවැලි ව්‍යාපාරය ආශ්‍රිත ජනපද තුළ සමාජ ප්‍රශ්න රැසක් මතු වී ඇත. සිය දිවි හානිකර ගැනීම් ප්‍රතිශතය ගත් කළ එයින් වැඩි ප්‍රමාණයක් සඳහන් වනුයේ මෙම ප්‍රදේශ වලිනි. ඊට අමතරව වෙනත් සමාජ විරෝධී ක්‍රියා ද මෙම ප්‍රදේශ වල මතු වෙමින් පවතින බවත් පෙනේ.

23 පිටුවට ➪

22 වැනි පිටුවෙන්
**සාම්ප්‍රදායික ගැමි සමාජයේ සහභාගීත්ව.....**

නව ජනපද වල දක්නට ලැබෙන විශේෂ ලක්ෂණයක් නම් ජල කළමනාකරණ ක්‍රියාවලිය තුළ ද සාමූහික තීරණ ගැනීමේ ක්‍රියාවලිය මගින් සාම්ප්‍රදායික ගැමි කෘෂිකර්මාන්තය තුල දක්නට ලැබුණු පංගු ක්‍රමය බෙත්ම ක්‍රමය වැනි වටිනා ලක්ෂණයන් මෙම ප්‍රදේශ වලින් කෙමෙන් ඉවත් වෙමින් පවතී. මෙම ප්‍රදේශ වල නියමිත කාලයක් තුළ වතුර නිකුත් කිරීම නිසා එම කාලය තුළ වගා කිරීමට සිදු වන හෙයින් තමන්ගේ ඉඩම් පමණක් රැක බලා ගන්නා තත්ත්වයට අද පත් වී ඇත. ඒ අනුව ජනපදය තුළ තම අසල්වැසි ගොවියාට ජලය ලැබුන ද නො ලැබුන ද තමන්ගේ කුඹුරු වගා කිරීම සඳහා අවශ්‍ය කරන ජලය ලබා ගැනීම සඳහා ඔවුන් නිතැතින්ම පෙළඹී ඇති ආකාරයක් දක්නට ලැබේ. මෙම තත්ත්වයන් තුල සාමූහික ක්‍රියාවලිය වෙනුවට ජලය බෙදා ගැනීමේ දී ඔවුන් අතර නොයෙකුත් ගැටළු සහගත තත්ත්වයන් මතු වී ඇත. ඒ තුළ ඔවුන් සතුව පැවතියා වූ සාමූහික බව, ඥාති සබඳතා, අසල්වැසියෝ යන හැඟීම් වලින් ඈත් වී පෞද්ගලිකත්වය නමැති ලක්ෂණය ඔවුන් තුළින් විදහා පාන ස්වරූපයක් අපට දක්නටලැබේ.

එසේ ම සාමූහිකත්වය මත පදනම් වී තිබුනු සාම්ප්‍රදායික ගැමි කෘෂිකර්මාන්තය පුද්ගලිකත්වය මත පදනම් වූ සමාජ ක්‍රමයක් දක්වා වෙනස්වීමකට ලක් වී ඇත. එම තත්ත්වය තුල ජනපදිකයන් තම වගා කටයුතු සඳහා අවශ්‍ය කරන යෙදවුම් ලබා ගැනීම, තම අස්වනු අලෙවි කිරීම, තම අවශ්‍යතා අනුව පාරිභෝගික ද්‍රව්‍ය මිලදී ගැනීම වැනි දෑ වෙළඳපල මත තීරණය වන හෙයින් ඔවුන් වෙළඳපල ආධිපත්‍යයට ද නතු වී ඇති ආකාරයක් පෙනේ.

සාම්ප්‍රදායික කෘෂියාර්මික සමාජය තුළ තිබුනා වූ සම්ප්‍රදායික සංස්ථා අහෝසි වී ගොස් ඇති අතර, නව නිලධාරී පැලැත්තියකින් යුක්ත කළමනාකරණයක් පැමිණ ඇත. එම තත්ත්වය තුළ සාම්ප්‍රදායික ගැමි සමාජය තුළ තිබුනා වූ ගැමි නායකත්වය අහෝසි වී ගොස් ඇති අතර ප්‍රභූ තනතුරුවල තිබුනා වූ ගාම්භීරත්වය වැනි ලක්ෂණ එම සමාජයෙන් ඉවත්වී ගොස් ඇත. විශේෂයෙන් මහවැලි ව්‍යාපාරය ගත් කළ එම ප්‍රදේශ වල ඉඩම් භාවිතය ගත් කළ ජනගහනය වැඩිවීමේ ප්‍රතිඵලයක් ලෙස ඉඩම් කුඩා කොටස් වලට කැඩී යාමත්, එයින් ලද හැකියා ඵලදායීතාවයේ අඩුවීමත් දක්නට ලැබේ. එසේම ගොවියා අතරමැදි මුදලාලි පැලැත්තියේ ග්‍රහණයට ද හසු වී ඇත. එසේ ම මෙම තත්වයන් තුළ ජනපදවල පදිංචි කල ගොවි ජනතාව අතර පවතින ගැටළු සහගත තත්ත්වය හේතු කොට ගෙන ඉඩම් අඳයට දීම, විකිණීම හෝ වී පොරොන්දුවට දීම කරනු ලබයි. මෙහි දී ගොවියා එම තත්ත්වයටපත් වී ඇත්තේ වෙළඳපල මතම ඔවුන්ගේ යැපීම වඩාත් වේගවත් වීමතුළ නිෂ්පාදන ක්‍රියාවලියේ පවතින අවදානමට ඔවුන්ට මුහුණදීමට ඇති නොහැකියාව නිසා බව දැක්විය හැක. එමෙන් ම මෙම තත්ත්වය තුළ ඔවුන්ගෙන් වැඩි දෙනෙකු අද ඉඩම් හිමිකමින් ඉවත් වී තමාගේ ඉඩමේ කුලියට වැඩ කරන කුලී ශ්‍රමික පිරිසක් බවට පත් වී ඇති ආකාරයක් ද දක්නට ලැබේ.

මේ අන්දමින් බලන විට නවීකරණ ක්‍රියාවලිය තුළ ශ්‍රී ලංකාවේ සාම්ප්‍රදායික ගැමි කෘෂිකර්මාන්තය තුළ තිබුනාවූ සහභාගීත්ව සංවර්ධනයේ හරයන් හා වටිනාකම් පද්ධතිය වෙනස්වීමකට ලක්වනු අතරම සමාන අයිතිවාසිකම් සහිත ගොවිපල පවුල් ක්‍රමය වෙනුවට සමාජ අසමානකම් හා වෙළඳපල ආර්ථික කරුණු පදනම් කරගෙන ග්‍රාමීය කෘෂිකාර්මික සමාජය තුළ නව පංති පෙල ගැසීමක් විශේෂයෙන් ජනපද ක්‍රියාවලිය තුළ දී දක්නට ලැබේ.